# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුකූල නොවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට යොමුව | අවශ්‍යතාවය | අනුකූල නොවීම |
|---|---|---|---|
| ඉන්වෙන්ට්‍රි | කු.ම.ප.ව්‍යා. සඳහා වූ ශ්‍රී.ගි.ප්‍ර. වල 13 වගන්තිය. | ආයතනය විසින් වටිනාකම ගණනය කිරීමේදී ඉන්වෙන්ට්‍රිවල අවම පිරිවැය සහ ඇස්තමේන්තුගත විකුණුම් පිරිවැය යන දෙකින් විකිණීමට හෝ සම්පූර්ණ කිරිමට අදාල අඩු පිරිවැයට ගණනය කල යුතුය. | (i) රු. 2,034,054 ක් වටිනා නිශ්චල විෂයයන් 27 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.<br><br>(ii) 2012 වර්ෂයට අදාල රු. 419,556 ක් වටිනා කළමනාකරණ දින පොත් ඉන්වෙන්ට්‍රිවල ඇතුලත් කර තිබුණි. |

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 1,128,000 ක් වූ පරිත්‍යාග, පරිත්‍යාග වශයෙන් දක්වනවා වෙනුවට වෙළඳ කටයුතු වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක. අ/1/2010/01 දරන චක්‍රලේඛයේ නියමයන්ට පටහැනිව රු. 149,265 ක් වූ විදේශ ගමන් දීමනාවක් වැරදි ලෙස ගණනය කිරීම හේතු කොටගෙන නිලධාරියෙකුට වැඩිපුර ගෙවා තිබුණි.

1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| පාලන ගිණුම්වල විස්තරය | ගිණුම් අනුව ශේෂය | උපයෝගි වාර්තා වල විස්තරය | උපයෝගි වාර්තා අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | රු. | | රු. | රු. |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු | 24,371,043 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අවසාන ගිණුම් | 26,948,539 | 2,577,496 |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයට ගෙවිය යුතු | 54,179 | ශ්‍රීලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයේ අවසන් ගිණුම් | 44,484 | 9,695 |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයට | | ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයේ | | |

| | | | | |
|---|---|---|---|---|
| ගෙවිය යුතු | - නැත - | අවසාන ගිණුම් | 4,417,949 | 4,417,949 |

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 සහ 2008 වර්ෂවලට අදාලව පිළිවෙලින් රු. 2,827,822 ක් සහ රු. 8,980,922 ක් වූ ණය හිමියන් පියවා නොතිබුණි.

(ආ) ඉන්දියානු චිත්‍රපට ඇකඩමි සම්මාන උළෙලේ සංවිධායක ආයතනයෙන් ලැබිය යුතු මුදල් එම ආයතනයෙන් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කල තොරතුරුවලට අනුව, ඉහත ආයතනය වෙනුවෙන් කාර්යාංශය ලබා දී තිබුණු හෝටල් කාමර පහසුකම් වෙනුවෙන් එම ආයතනයෙන් දළ වශයෙන් රු. මිලියන 20 ක් අයකර ගත යුතුව තිබුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

-----------------------------------

ගිණුම්වල පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | විස්තරය | වටිනාකම | නොසැපයූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | බාහිර වාර්තාකරුවන්ගේ වැඩ සටහන | 26,438,483 | පවත්වන ලද වැඩ සටහන් සංඛ්‍යාව සහ මාධ්‍ය ප්‍රකාශන සම්බන්ධව තොරතුරු |
| (ආ) | වෙළඳ ප්‍රදර්ශන- International Travel Borse | 32,565,827 | විස්තරාත්මක උපලේඛන |
| (ඇ) | වෙළඳ ප්‍රදර්ශන - ලෝක සංචාරක වෙළඳපල | 29,868,208 | විස්තරාත්මක උපලේඛන |
| (ඈ) | විදේශ කටයුතු අංශය මගින් දරන ලද ප්‍රවර්ධන වියදම් | 55,427,296 | ඉන්වොයිස් |
| (ඉ) | කලින් ගෙවීම් | 2,808,927 | තහවුරු කිරීම් |
| (ඊ) | ලැබිය යුතු ගිණුම් | 481,324,185 | තහවුරු කිරීම් |
| (උ) | ඉන්වෙන්ට්‍රි | 291,912 | භෞතික සත්‍යාපන වාර්තා |

1.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2005 අංක 38 දරන සංචාරක පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උප වගන්තිය. | සෑම ලිත් වර්ෂයක් අවසානවී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙත පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි.<br><br>(අ) ලිත් වර්ෂයේ මාස හතක් අවසාන වීමට පෙරාතුව අර්ධ වාර්ෂික ගිණුම්වල පිටපතක්<br>(ආ) පෙර වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද සැලසුම් සම්බන්ධයෙන් වූ කාර්ය සාධනය සහ ඉෂ්ඨ කර ගැනීම් ඇතුලත් ප්‍රකාශයන් |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ චක්‍රලේඛය. | |
| (i) 5 පරිච්ඡේදයේ 5.1.3 වගන්තිය | මුදල් වර්ෂය ආරම්භවීමට අවම වශයෙන් දින 15 වකට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපතක් විගණකාධිපති වෙත එවිය යුතුය. කෙසේ වුවද, මේ නියමයන්ට අනුකූල වීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. |
| (ii) 9 පරිච්ඡේදයේ 9.12 වගන්තිය. | ව්‍යාපාර විසින් පිහිටුවනු ලබන ඕනෑම සුභසාධක යෝජනා ක්‍රමයක් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. කෙසේ වුවද, සේවක වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය වන අනුමැතිය |

| | | |
|---|---|---|
| | | ලබාගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. |
| | (iii) 9 පරිච්ඡේදයේ 9.14.1 වගන්තිය | මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් වන සියළුම කාරණා පිළිබඳව පනවනු ලබන රීති සහ රෙගුලාසි භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සමග අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල යුතුය. කෙසේ වුවද, කාර්යාංශය මෙම අවශ්‍යතාවයට අනුකූලවීමට අසමත් වී තිබුණි. |
| (ඈ) | 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛයේ 4 පරිච්ඡේදයේ 4.2.1 (අ) සහ (ඇ) වගන්තිය. | ඉදිරි වර්ෂය සඳහා වූ සවිස්තරාත්මක සැලැස්ම සමග අවම වශයෙන් වසර තුනක් ආවරණය වනසේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද කාර්යාංශය එම අවශ්‍යතාවයට අනුව එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ඇ) | 2008 ජනවාරි 11 දිනැති පීඊඩී/56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉදිරි මාස 06 ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සැලකිල්ලට ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනවල අතිරේක මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද, කාර්යාංශය විසින් අතිරේක මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. විගණනය විසින් කරන ලද ගණනය කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ අතිරේක මුදල් ප්‍රමාණය රු. මිලියන 1000 ක් පමණ විය. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දරන අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | කාර්යාංශය සතු පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් චක්‍රලේඛයේ අවශ්‍යතාවය පරිදි පවත්වා නොතිබුණි. |
| (ඊ) | 2011 පෙබරවාරි 11 දිනැති පීඊඩී/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | රු. 100,000 ඉක්මවන ඕනෑම පරිත්‍යාග / අනුග්‍රහ සඳහා ගරු මුදල් හා සැලසුම් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සියළුම රාජ්‍ය ව්‍යාපාර වල අවශ්‍යතාවයකි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුලදී ඉහත අනුමැතිය රහිතව රු. 1,128,000 ක් පෞද්ගලික ආයතන 2 කට පරිත්‍යාග කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු. 476,209,102 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 551,545,914 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 75,336,812 ක අඩුවීමක් දැක්වුණි. වාණිජ කටයුතු සම්බන්ධ වියදම - දේශීය රු. 279,333,441 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි අඩුවීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ ආදායම රු. මිලියන 1,444 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු. මිලියන 1,248 සමග සැසඳීමේදී සියයට 15.7 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ වෙළඳ කටයුතු, අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු. මිලියන 697 සමඟ සැසැඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී ඒ සඳහා රු. මිලියන 968 ක් වැයකර තිබුණි. මේ අනුව සියයට 39 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමහර වැදගත් අනුපාත පහත දක්වා ඇත.

| ස්කන්ධ අනුපාත | සම්මත අනුපාතය | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| ජංගම අනුපාතය | 2.1 | 2.84 | 3.28 | 2.47 |
| ක්ෂණික අනුපාතය | 1.1 | 2.83 | 3.25 | 2.45 |

3.	මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1	කාර්ය සාධනය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)	සමාලෝචිත වර්ෂය තුලදී රු. මිලියන 876 ක් වෙළඳ කටයුතු සම්බන්ධ වියදම් වෙනුවෙන් දරා තිබුණි. කෙසේ වුවද සංචාරකයන්ගේ පැමිණීම බලාපොරොත්තු වූ පරිදි වැඩි වී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| රාජ්‍යය | දරන ලද මුළු වියදම | සංචාරකයන් පැමිණීමේ වර්ධනය | දරන ලද මුළු වියදම | සංචාරක පැමිණීමේ වර්ධනය |
| -------- | --------------- | ---------------------- | ---------------------- | ---------------------- |
| | රු. | % | රු. | % |
| එක්සත් රාජධානිය | 101,492,242 | 7.7 | 113,372,372 | 0.6 |
| ජර්මනිය | 39,246,721 | 28.2 | 43,302,313 | 22.2 |
| ප්‍රංශය | 20,545,444 | 16.8 | 20,016,035 | 55.6 |
| රුසියාව | 25,927,841 | 32.8 | 30,991,787 | 61.1 |
| නෙදර්ලන්තය | 4,044,308 | 11.6 | 7,186,800 | 34.2 |
| ඉන්දියාව | 9,812,701 | 2.9 | 835,974 | 35.1 |
| චීනය | 345,319,913 | 58.1 | 12,859,576 | 56.4 |
| ජපානය | 15,923,952 | 26.7 | 8,018,073 | 43.7 |
| මැදපෙරදිග රටවල් | 30,521,920 | - 0.3 | 14,153,406 | 53.2 |
| මලයාසියාව | නැත | 35.3 | නැත | 20.4 |

| | | | | |
|---|---|---|---|---|
| ස්විස්සර්ලන්තය | නැත | 42.1 | නැත | 49.7 |

(ආ) මාධ්‍යකරුවන් පැමිණීමේ වැඩ සටහන් සහ සංචාරයන් සඳහා හුරු කිරිමේ වැඩ සටහන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී ඉහත වැඩ සටහන් සඳහා රු. මිලියන 26.43 ක වියදමක් දරා තිබුණි. කෙසේ වුවද, උපරිම ප්‍රතිලාභ රටට ලබාදීම පිණිස, සුදුසු සහ වාසිදායක මධ්‍යකරුවන් තෝරා ගැනීම මුල් කර ගත් සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කල යුතු වැඩ සටහන් සංඛ්‍යාව සැලසුම් කර නොතිබුණි. මේ අනුව, විධිමත් මාධ්‍යය තෝරා ගැනීමේ සැලසුමකින් තොරව තත්කාර්ය පදනමකින් මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය තුලදී මාධ්‍ය හුරු කිරීමේ සංචාරක 57 ක් සඳහා මාධ්‍යකරුවන් 183 ක් සහභාගි වී තිබුණි. එසේ වුවත්, අපේක්ෂිත ප්‍රතිඵල ලහාකර ගැනීම පිණිස වැඩ සටහන් සඳහා මාධ්‍යකරුවන් තෝරා ගැනීමේ නිර්නායක තීරණය කර නොතිබුණි.

(iii) වැඩ සටහන් මගින් අපේක්ෂිත පරිදි මාධ්‍ය ප්‍රචාරයන් ඉටු කිරීම සම්බන්ධ සාක්ෂි විගණනයට නොලැබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 45 කට වැඩි ප්‍රමාණයක් පුරප්පාඩු පවතී. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මානව සම්පත් සඳහා මුළු පිරිවැය පිළිවෙලින් රු. මිලියන 28.6 ක් සහ රු. මිලියන 25.8 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ එක් සේවකයෙකු සඳහා වූ වියදම පිළිවෙලින් රු. 622,400 ක් සහ රු. 562,874 ක් විය.

(ආ) 2005 අංක 38 දරන සංචාරක පනතේ VII වගන්තියේ සඳහන් නියමයන් සැලකිල්ලට නොගෙන කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

3.3 වාහන උපයෝජනය

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී කුලියට ගත් වාහන දෙකක් සඳහා රු. 6,591,906 ක් ගෙවා තිබුණි. කුලියට ගත් වාහන සඳහා කි.මී. එකකට පිරිවැය රු. 56.32 ක් විය.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී කුලියට ගත් වාහන වල පිරිවැය රු. 4,237,828 කින් හෙවත් සියයට 180 කින් වැඩි වී තිබුණි.

4. ගිණුම්කටයුතු භාවය සහ යහ පාලනය

------------------------------------------

4.1 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනයක් පිළියෙල කර තිබුණද,1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තියේ නියමයන් පරිදි මුදල් වර්ෂයට මාස තුනකට පෙරාතුව අයවැය ලේඛනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී විෂයයන් 22 ක අයවැයගත ප්‍රමාණය සහ තථ්‍ය ප්‍රමාණයන් අතර සියයට 7 සිට සියයට 1331 ක පරාසයක වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

5. පද්ධති හා පාලන

-------------------

මුදල් පනතේ 13(7) (අ) වගන්තිය යටතේ නිකුත් කරන ලද මාගේ සවිස්තරාත්මක වාර්තාව මගින් විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ප්‍රවර්ධන ක්‍රියාකාරකම්
(ඇ) අයවැය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) ප්‍රසම්පාදනයන්
(ඊ) අභ්‍යන්තර විගණනය